# ජාතික අධ්‍යාපන ආයතනය

## අයදුම්පත් කැඳවීම

## විශේෂ අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව - 2024

ජාතික අධ්‍යාපන ආයතනයේ අන්තර්කරණ අධ්‍යාපන දෙපාර්තමේන්තුව මඟින් මෙහෙයවනු ලබන විශේෂ අධ්‍යාපනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

**පාඨමාලාවේ ස්වභාවය**
දරුවන්ගේ දෘෂ්ටි ඌනතා, ශ්‍රවණ ඌනතා, කායික දුබලතා, බුද්ධිමය දුබලතා, ඕටිසම් තත්ත්වය හා වෙනත් ඉගෙනුම් දුෂ්කරතා නිසා මතුවන ඉගෙනීමේ ගැටලු ඇතුළත් විශේෂ අධ්‍යාපන අවශ්‍යතා හඳුනාගෙන ඔවුන් සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය මූලික නිපුණතා ලබා දීමේ අරමුණ ඇතිව ක්‍රියාත්මක කරනු ලබන අර්ධකාලීන පාඨමාලාවක් වේ. අධ්‍යයන සැසි මාර්ගගත ක්‍රමය ඔස්සේත්, ජාතික අධ්‍යාපන ආයතනයේදීත්, ප්‍රායෝගික සැසි තෝරා ගත් ආයතනවලදීත් පැවැත්වේ. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පාඨමාලා සඳහා සකස් කර ඇති ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව (SLQF Sri Lanka Qualifications Framework – Level 03) අනුව මෙම පාඨමාලාව සකස් කර ඇත

**අයදුම් කිරීම සඳහා සුදුසුකම්**

2024-10-15 වන දිනට වයස අවුරුදු 55 ට අඩු අයෙකු වීම

**අ. පො. ස. (උ. පෙළ )** සමත් වීම
සහ
රජයේ හෝ රජයේ අනුමත පාසලක හෝ පිරිවෙනක ගුරුවරයකු වීම
හෝ
ජාතික අධ්‍යාපන විද්‍යා පීඨයක / ගුරු විද්‍යාලයක ගුරු අධ්‍යාපනඥයකු වීම
හෝ
ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ / ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරියකු වීම
හෝ
ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිලධාරියකු වීම හෝ විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත දරුවන් සඳහා වූ පාසලක / ආයතනයක සේවයේ යෙදී සිටින්නකු වීම

**පාඨමාලාවට තෝරා ගැනීම -** ලිඛිත පරීක්ෂණයක්, සම්මුඛ පරීක්ෂණයක් යන දෙකම හෝ ඉන් එකක් මඟින් සුදුස්සන් තෝරා ගනු ලැබේ.

**පාඨමාලා ගාස්තු**

| | **ගාස්තු** |
|---|---|
| ඉල්ලුම්පත් ගාස්තුව<br>ලියාපදිංචි ගාස්තුව<br>පාඨමාලා ගාස්තුව | 200.00<br>1,000.00<br>40,000.00 (වාරික 2 කින් ගෙවිය හැකිය) |

✓ **සියලුම ගෙවීම් බැංකු කාඩ්පත් මඟින් (Credit හා Debit) සිදු කළ හැකිය**

**අයදුම් කළ යුතු පිළිවෙළ**

ඉහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් ජාතික අධ්‍යාපන ආයතනයේ විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියට පිවිස https://www.exams.nie.lk/intakes/new යොමුව ඔස්සේ මාර්ගගතව පමණක් අයදුම්පත්‍ර යොමු කළ යුතු ය.
මාර්ගගතව අයදුම්පත් යොමු කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස් පහත යොමුව මඟින් ලබාගත හැක.
(https://www.exams.nie.lk/info/applying-for-new-enrollments)

විමසීම් - ඉල්ලුම්පත්‍ර යොමු කිරීමේදී ඇතිවන ගැටලු සඳහා - (0117601776/0117601777)
පාඨමාලාව පිළිබඳ තොරතුරු දැනගැනීම සඳහා - (0117601657/0117601659/0117601661/0117601662)

අයදුම්පත් යොමු කළ යුතු අවසාන දිනය 2024.10.15

අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම.
2024.08.28